**වෂර් 2021 ක්වූ මැයි මස 18 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා**

**රැස්වීමේ වාතර්ාව**

වේලාව - පෙරවරු 10.00

- ❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.G ගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ි රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05. .S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 R.M උදයකුමාර දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07. R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08 M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09. A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10. W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11.R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12. W .ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13. කුමාරවේලු කනගරත්නම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14. H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. G.A අරුණ ප්‍රසන්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16. H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17. තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18.N.R.M.D නවරත්න රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19.A.C මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20.W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 21.මුතු නීලමේගම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22. සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 23.H.G සුබද්‍රා සමරනායක මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |

24.ගයානී ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

25.P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

26.චාමික රුවන් දසනායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්

27. W.M.G.W.C.B වේරපිටිය මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

28. U.G පාලිත මහින්ද ජිනදාස මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

29.D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

30.D.M දීසායු මංජුල දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

31. D.G ජයන්ත කීතරීසිංහ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

32.M.G උපචන්ද්‍ර ජයපති මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

33.A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

34.A. සමන්ත කුමාර ආරියදාස මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

35. D.W.G හේමකුමාර නයනානන්ද මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

36.M.G මොහොමඩ් මුරාඩ් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

37. R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38.H.G සුසිලාවති මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

39. K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

40.වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

41.පිච්චෙයි සෙල්වපූනේස්වරි මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

42.. K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

43.G.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම

පසුගිය අප්‍රේල් මස 09 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

පසුගිය අප්‍රේල් මස 09 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

පසුගිය අප්‍රේල් මස 09 වන දින මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිලිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු තංගවේළු කාමරාජන් මන්ත්‍රීතුමා**

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව* සභා වාර්තාව *ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

**ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

1.ග්‍රාමීය හා සාම්ප්‍රදායික ගම්මාන ඒකාබද්ධ සංවධර්න වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාතර්මේන්තුවෙන් එවා ඇති නිවේදනය සභා ගත කරන ලදි.

2. උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂර්ය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන පිලිබදව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1)උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවට අදාල නිවේදනය සභා ගත කරන ලදි.

3. CLP/KD/F/PS-UP/05/2020/705-1හා 2021 අප්‍රේල් මස 16 දිනැති ජාතික විගණන කායර්ාලයෙන් එවා ඇති විගණන විමසුමට අදාල නිවේදනය සභා ගත කරන ලදි.

4. CLP/KD/F/PS-UP/05/2020/705-11 හා 2021 අප්‍රේල් මස 19 දිනැති ජාතික විගණන කායර්ාලයෙන් එවා ඇති විගණන විමසුමට අදාල නිවේදනය සභා ගත කරන ලදි.

5. 2021.04.27 දිනැති ප්‍රාදේශීය පරිසර කමිටුව නොපවැත්වීම සම්බන්ධ නිවේදන සභාගත කරන ලදි.

3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සඳහන් කරන ලදි.

4.කල් දී ඇති ප්‍රශ්න - නොමැති බව සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා
5.කල් දී ඇති යෝජනා

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1)</u>

(5).1.**<u>ගරු සභාපති ඩී.ජී.ගුණසේන මැතිතුමාගේ යෝජනා</u>**

5(1.1) පලාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වෂර්යේ අයවැය යෝජනාවට අදාලව කසල කළමනාකරන සම්බන්ධයෙන් රු.මිලියන 2.5 ක් පමණ වටිනා කසල දාහකයක් මිලට ගැනීම සුදුසු බවත් එයට වඩා වැඩි මුදලක් වැය කිරීමට සිදුවුවොත් එම මුදල සහා අරමුදලෙන් වැය කිරීම සුදුසු බවත් මම යෝජනා කරමි.

**<u>ගරු කීතරි රත්නායක මන්ත්‍රීතුමා</u>**

උඩපළාත ප්‍රාදේශීය සභාවට අත්‍යවශ්‍ය වූ කසළ දහනය කල හැකි යන්ත්‍රයක් මිලදී ගැනීමට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි. තවද රු.මිලියන 2.5 කට වඩා වැඩි මුදලක් යන්ත්‍රය මිලදී ගැනීමට වැය කලයුතු උවහොත් එම මුදල සහා අරමුදලෙන් යෙදවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (2)</u>

5(1.2) 2019 වෂර්යට අදාල මූල්‍ය ප්‍රකාශනය විගණනය කිරීම වෙනුවෙන් ජාතික විගණන කායර්ාලය වෙත විගණන ගාස්තු වශයෙන් රු. 141900.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>**

2019 වෂර්යට අදාල මූල්‍ය ප්‍රකාශනය විගණනය කිරීම වෙනුවෙන් ජාතික විගණන කායර්ාලය වෙත විගණන ගාස්තු වශයෙන් රු. 141900.00 ක මුදලක් ගෙවීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඉදිරපත් කල යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 .1(3)</u>

5(1.3) නාගරික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන( Yaarl Reisen pvt ltd) ආයතනය විසින් සංවිධානය කර ලද වියට්නාමයේ පැවැත්වෙන අතර ඒ සඳහා ලියාපදිංචි ගාස්තුව ලෙස රු.3000.00ක මුදලකුත්, වැඩසටහන සඳහා රු.196000.00කක මුදලක් වැයවන බවත් 2021. ජූලි මස12 දින සිට 18 දින දක්වා වැඩසටහන පැවැත්වෙන බවත් මේ සඳහා මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් සහභාගී වන බැවින් උඩපළාත ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියට අවස්ථාව ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා

මෙම පුහුණු වැඩසටහන සඳහා ලේකම්වරුන් සහභාගී වීම ඉතා වැදගත් අවස්ථාවක් බවත් මෙම වැඩසටහන තුළින් බල ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට වටිනා මෙහෙවරක් සිදුවන බවත් ගරු සභාපතිතුමා සහ මන්ත්‍රී මණ්ඩලය වෙනස් වන නමුත් රජයේ නිළධාරින් විශ්‍රාම යනතෙක් රාජකාරි කටයුතු වල නියළෙන නිසා වඩා වැදගත් බවත් ඔන්ලයින් හරහා වැඩසටහන් සිදු කරන නමුත් අදාළ රටට ගොස් එම පුහුණුව ලබාගැනීමට අවස්ථාව ලැබේවා කියා ප්‍රාථර්නා කරමින් එම යෝජනාව ස්ථිර කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

කසළ ප්‍රතිචක්‍රීකරණ කටයුතු සම්බන්ධයෙන් මුළු රටේම අවධානය යොමු වී ඇති අවස්ථාවේ පුහුණුවක් ලබාදීමට යෝජනා වීම ඉතා වැදගත් බවත් නමුත් පුහුණුවෙන් අනතුරුව එහි ප්‍රතිඵල මේ රටට ජනතාවට ලබාගැනීම සඳහා පළාත් පාලන ආයතන වලින් සහභාගී වන ලේකම්වරුන් පළාත් පාලන ආයතන තුළම පමණක් රඳවා තබා ගෙන අදාළ ක්ෂේත්‍රයේ කටයුතු සඳහා සහභාගි කරවා ගැනීමට වෙනත් ආයතන වෙත ස්ථාන මාරු නොකිරීමත් ඉතා වැදගත් බව සඳහන් කරන ලදි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

මහජන නියෝජිතයින් ලෙස අපටද මේ සඳහා අවස්ථාවක් ලබාදිය යුතු බවත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ලේකම්තුමිය කටයුතු කරන බවත් පාරිසරික ගැටළු සම්බන්ධයෙන් මහජන නියෝජිතයින් ලෙස අපි මුල් වී කටයුතු කරන නිසා සෑම පළාත් පාලන ආයතනයකින්ම මහජන නියෝජිතයින් දෙදෙනෙකු පුහුණුව සඳහා යොමු කරන ලෙස ඉල්ලා සිටින යෝජනාව පළාත් පාලන අමාත්‍යාංශයට ඉල්ලීමක් කරන ලෙස සඳහන් කරන ලදි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

ලේකම්තුමිය කසළ කළමනාකරණ පුහුණුව ලබාගෙන පැමිණ එම දැනුම අපේ පරිසර අංශයේ නිළධාරින්ට ලබාදෙන ලෙසත් සඳහන් කරමින් මෙම ගමන ලේකම්තුමියට ඉතා ඉක්මනින් යාමට ලැබේවායි ප්‍රාථර්නා කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අවස්ථාවක් ලදොත් මහජන නියෝජිතයින් යැවීමට කටයුතුකරන බව සඳහන් කරමින් *ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (4)

5(1.4)පාර දෙක පොදු වැසිකිලිය අළුත්වැඩියාව සම්බන්ධ ඇස්තමේන්තු මුදල රු.220000.00 එම මුදල යොදවා අළුත්වැඩියාව ඉටු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

ඉතාම අත්‍යාවශ්‍ය කාරණාවක් ලෙස පාර දෙක පොදු වැසිකිලිය අළුත්වැඩියාව කිරීම කල යුතු බවත් කඩ කාමර 4ක් වාෂරීක බදු පදනම මත ලබාදී ඇති නිසා එම අයගේ ප්‍රයෝජනය

පිණිස හා පාරදෙක ප්‍රදේශවාසී ජනතාවට මෙතෙක් කල් තිබූ පහසුව අහිමි වී ඇති නිසාත් රු.220000.00 මුදල යොදවා අළුත්වැඩියාව කිරීම සුදුසු බව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (5)

5(1.5) ගම සමග පිලිසදර වැඩ සටහන ආශ්‍රිත ව්‍යාපෘති 2021මධ්‍යම පලාත මැයෙන් එවා ඇති ලිපියට අනුව උඩපළාත ප්‍රාදේශීය සභාවට යන්ත්‍රෝප කරණ ,වාහන හා ඒවා නවතා තැබීමේ පහසුකම් (garage) නඩත්තු/අළුත්වැඩියා කිරීම වෙනුවෙන් මිලියන 3.7 ක මුදලක් යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා**

ගම සමග පිලිසදර වැඩ සටහන යටතේ මිලියන 3.7 ක මුදලක් වැයකර අපේ කාලය අවසන් වීමට පළමුව වැඩ අවසන් වනවා දැකීමට සියළු දෙනාකැමති හෙයින් රජයේ මුදල් ප්‍රතිපාදන වැය කර මෙවන් වසංගත තත්වයක් තිබියදී මෙවන් සංවධර්න කටයුතු ඉටුකිරීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙමින් මෙම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තමා ආදාහනාගාරයේ සම්පූණර් තොරතුරු ලබාගැනීමට සාකච්ඡා කල බවත් ඉතා ඉක්මනින් එම කටයුතු ඉටු කරන බවත් පුස්සැල්ලාව වෙළඳ සංකීණර්යේ කටයුතු ජූලි මාසයේ ආරම්භ කරන බව සදහන් කරන ලදි.

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (6)

05.1 (6) වහුගපිටිය රෝහලේ දැනට කොරෝනා රෝගීන් ප්‍රතිකාර පිණිස යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සුදානම් කර ඇති නිසා එම රෝහලේ වැසිකිලි වලවල් දෙකෙහි අපදව්‍ය ගලි බවුසර් දමා ඉවත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**

වහුගපිටිය රෝහල දැනට කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර සදහා යොදවා ගැනීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇති නිසා වහුගපිටිය රෝහලේ වැසිකිලි වලවල් දෙකෙහි අපදව්‍ය ගලි බවුසර් දමා ඉවත් කිරීම සුදුසු බවට ගෙන ආ මම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (2,1)

ගරු කුමාරවේළු කනගරත්නම් මන්ත්‍රීතුමාගේ යෝජනා

5 (2 .1) වතු ජනතාවගේ නම් ඡන්ද හිමි නාම ලේඛනයෙන් ඉවත් කර ඇති බැවින් එම නම් නැවත ඇතුළත් කරගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

තමාගේ ඡන්ද අයිතිය ග්‍රාම නිළධාරි විසින් ඉවත් කර ඇති බවත් තමාගේ මව හා පියා කනපදිවත්තේ පදිංචිව සිටින බවත් තමා සහ පවුලේ අය සතියකට වරක් එම නිවසට යන බවත් ගම්පොල නගරයේ නොසිට කනපදිවත්තේ පමණක් සිටින ලෙස ග්‍රාම නිළධාරි විසින් තමාව දැනුවත් කල බවත් තවද තමා කුළියට සිටිනවාද මිළදී ගෙන සිටිනවාද යන්න නොවිමසන බවත් ඡන්ද ලැයිස්තුවෙන් නම ඉවත් කලොත් තමාට මැතිවරණ සඳහා ඉදිරිපත් විය නොහැකි බවත් ඡන්දය ඉල්ලනවා නම් උඩපළාත සීමාව තුළ පදිංචිව සිටිය යුතු බවට නීතියක් පවතින බවත් ග්‍රාම නිළධාරි දෙදෙනාම එකතු වී තමාගේ නම ඉවත් කර ඇති බවත් තමා ග්‍රාම නිළධාරිවරුගේ ප්‍රධානියා හමු වූ බවත් එතුමාද නිළධාරින්ගේ මතය අනුමත කල බවත් තමා තේරීම්භාර නිළධාරි හමුවීමට ගිය අවස්ථාවේ එතුමා එලෙස නම ඉවත් කල නොහැකි බවත් මහජන නියෝජිතයෙකුට එසේ කල නොහැකි බවත් සඳහන් කල බවද කනපදිවත්තේ වතු ජනතාවගේ නම් 36ක්ද නයාපාන වත්තේ නම් 47ක්ද ලේඛනයෙන් කපා ඉවත් කර ඇති බවත් එනිසා ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට ගොස් මේ තත්වය වෙනස් කල යුතු බවත් අපේ ජනතාව එක් පක්ෂයක් සමඟ නොඉඳ ඡන්දය භාවිතා කරන බවත් එනිසා මේ සම්බන්ධයෙන් තමාට සාධාරණයක් ඉටුවිය යුතු බව මම යෝජනා කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මේ සම්බන්ධයෙන් ගියවර සභාවේ ගරු කාමරාජන් මන්ත්‍රීතුමා කථා කල බවත් වතුවල පමණක් නොව අපේ ගම් වලද ඡන්ද ලැයිස්තුවෙන් නම් කපා දමා ඇති බවත් ප්‍රධාන වශයෙන් දමා ඇති නම් පමණක් ඉදිරිපත් කරන බවත් අනතුරුව සංශෝධන ඉදිරිපත් කරන ලෙස දන්වා එවා ඇති බවත්නමුත් ඒ සඳහා කිසිවකු ඉදිරිපත් නොවන බවත් ගරු කනගරත්නම් මන්ත්‍රීතුමාට මන්ත්‍රීවරයෙක් නිසා තමාගේ නම ඉවත් කර ඇතිබවට අවිශ්වාසයක් තිබෙන බවත් නමුත් ජූලි පළවෙනිදාට 2022 වෂර්ය සඳහා ඡන්ද හිමි නාම ලේඛන ඉල්ලන බවත් එවිට ග්‍රාම නිළධාරි දැනුවත් කර දැනට පදිංචි වසමේ ග්‍රාම නිළධාරිගේ ලිපියක් ලබාගෙන ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුළත් කිරිමට ඉදිරිපත් කරන ලෙස සඳහන් කරන ලදි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

මෙය හරිම ආන්දෝලාත්මක තත්වයක් බවත් තමා මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡා කල බවත් මහජන නියෝජිතයින් ලෙස මන්ත්‍රීවරු ගමේ අය සමඟ කටයුතු කරන බවත් නිතරම අපි පක්ෂ පාථ භේදයකින් තොරව වෛරය පිරිමසා ගන්නේ නැතිව අපි අපේ අනන්‍යතාවය රැකගත යුතු බවත් සහයෝගයෙන් කටයුතු කල යුතු බවත් පදිංචි නොමැති නම් ලේඛනයෙන් නම් ඉවත් කිරීමට ග්‍රාම නිළධාරින්ට අයිතියක් ඇති බවත් එනිසා මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටිමින් මෙම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>තීරණ අංක 05 (2,2)</u>

<u>ගරු කුමාරවේළු කනගරත්නම් මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

5 (2 .2) සිය මන්ත්‍රීධූරය අහෝසි කිරීම සම්බන්ධයෙන් තේරීම්භාර නිළධාරි විසින් එවන ලද ලිපිය ප්‍රමාද වී ලැබීම සම්බන්ධයෙන් මහ සභාව දැනුවත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

මාවතුර තැපැල් කායර්ාලයෙන් නිවැරදි ලෙස රාජකාරි කටයුතු ඉටු නොවන බවත් තමාගේ පක්ෂයෙන් තමාව ඉවත් කරන බවටඅදාළ ලිපිය 2021.03.15 දින තැපැල් කර තිබූ බවත් නමුත් මැතිවරණ කායර්ාලයෙන් එවා ඇති එම ලිපිය 2021.04.01 දින තමාට ලැබුණු බවත් 2,3 දින නිවාඩු දින බවත් 5 වෙනිදා වන විට දින 21ක් ගත වී ඇති බවත් නමුත් දින 21කට පෙර නීති මාගර්යෙන් කටයුතු කල යුතු බව දන්වා තිබූ බවත් තමාට ලබාදී තිබූ කාලය අවසන් වී ඇති නිසා තමා තේරීම්භාර නිළධාරිතුමා හමු වී මාද වී ලිපිය ලද බව දැන්වූ බවත් මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තක් සිදුවන නිසා උසාවියෙන් ලිපිය ප්‍රමාද වීමට හේතු විමසා ඇති බවත් මාවතුර තැපැල් කායර්ාලයෙන් වත්තට ලිපි ගෙනැත්දිය නොහැකි බවත් පැමිණ ලබාගත යුතු බවත් සදහන් කරන බවත් නමුත් අපට නිවැරදිව ලිපි ලැබිය යුතු බවත් එනිසා තමාට මාවතුර තැපැල් කායර්ාලයෙන් සාධාරණයක් ඉටුවිය යුතු බවත් ඉදිරි නඩු කටයුතු වලට යාමට මෙය බාධාවක් බවත් ඊළඟ නඩු වාරයට මේ සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා ඇති නිසා තමාට සාධාරණයක් ඉටු කරන ලෙසට සදහන් කරන ලදි.

<u>කමර්ාන්ත අනුමැතිය</u>

<u>කමර්ාන්ත යෝජනා</u>

<u>ගරු උප සභාපති අසේල අමරසේන මැතිතුමාගේ යෝජනා</u>

5 (2 .3) ගනේගොඩ අතුරු මාගර්ය සංවධර්නය කිරීම රු.100000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන ලෙස

මස්ගොල්ල විහාරස්ථානය අසල ජල යෝජනා ක්‍රමය ස්ථාපනය කිරීම රු.100000.00 ලෙස යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු ඒ.එච්.ඒ රත්නායක මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.4) වෙද ගෙදර සිට කලියානවත්ත මාගර්ය සංවධර්නය කිරීම රු.150000.00 කමර්ාන්ත වෙනුවට සංශෝධන ලෙස

ඉගුරුවත්ත ප්‍රධාන මාගර්ය සංවධර්නය කිරීම රු.150000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.5) ගල්ඔය ප්‍රධාන මාගර්යේ සුනිල් වෙලඳ සැල අසලින් ඉහලට යන මාගර්ය සංවධර්නය කිරීම රු.100000.00 වෙනුවට සංශෝධන ලෙස

ඉල්ලගොල්ල ගම මැදින් යන පියල් මයාගේ නිවස අසල ඇති බෝක්කුව අළුත්වැඩියා කිරීම රු.100000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු සමන්ත ආරියදාස මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.6) ඉහලගම ගල්පිහිල්ල ගමේ සිට කන්දේගම දක්වා ඇති පාර සංවධර්නය කිරිම රු.200000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන ලෙස

1.දුනුකේ උල්ල ප්‍රධාන මාගර්යේ සිට නිමල් මහතාගේ නිවස අසලින් හුනුකොටුගම දක්වා ඇති මාගර්ය සංවධර්නය කිරීම රු.150000.00 සහ

2.මැදගම්මැද්ද සමන්ත මහතාගේ නිවස අසල මාගර්ය සංවධර්නය කිරීම රු.50000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු දිනුක රත්නායක මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.7) නාරංවිට අලවතුගොඩ නාගස අසල මාගර්ය සංවධර්නය කිරිම රු.400000.00 වෙනුවට සංශෝධන කමර්ාන්ත ලෙස

1.නාරංවිට පුරාණ බෝධියට යන මාගර්ය කානුව සමග කොන්ක්‍රීට් කිරීම රු.200000.00 සහ

2.ඉගුරුවත්ත වසමේ කවුඩුපිටිය කපුකොටුව වත්ත මාගර්ය සංවධර්නය කිරීම රු.200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.8) ගල්ඔය හදබිම ජනපදයේ කෝවිල අසල පඩිපෙල සංවධර්නය කිරිම රු.200000.00 කමර්ාන්ත වෙනුවට සංශෝධන ලෙස

ගනේගොඩ ග්‍රාමසේවා වසමේ පිහිඹියාහේන පහල කොටසේ බෝධිය අසල මාගර්ය සංවධර්නය කිරිම රු.200000.00 ලෙස යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

(5) (2.9) පිහිඹියාහේන ජනපදයේ පහල කොටස දෙල්ගහමුල මාගර්යේ පඩිපෙල සංවධර්නය කිරිම රු.100000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන ලෙස

මෙගොඩ කළුගමුව හයිවේ පාකර් ඉඩමට යන මාගර්ය සංවධර්නය කිරීම රු.100000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.10) පිටවල කෝල්ග්‍රීන් ජනපනදයේ පිවිසුම් මාගර්ය සංවධර්නය කිරිම රු.250000.00 සහ හුණුගල අඹගහවත්ත හරහා ගංගොඩවත්ත පාර සංවධර්නය කිරිම රු.250000.00 වෙනුවට සංශෝධන ලෙස

මුල්ගම කුඩා ගම්මාන මාගර්ය සංවධර්නය තිරිම රු.500000.00 ලෙස යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු චමිලා ෆොන්සේකා මන්ත්‍රීතුමියගේ යෝජනා</u>

(5) (2.11) මාඋස්සාව මාගර්ය සංවධර්නය කිරිම රු.100,000.00 සැන්කුවාර් කමලාවති මියගේ නිවස අසල සිට සුජී මහතාග් නිවස දක්වා ඇති මාගර්ය සංවධර්නය කිරිම රු.50000.00,නුවරඑළිය මාගර්යේ සින්නයියා මහතාගේ නිවස ඉදිරියෙන් ඇති මාගර්ය සංවධර්නය කිරිම රු.100,000.00 යන කමර්ාන්ත වෙනුවට සංශෝධන ලෙස

1. සැන්කුවාර් පාරේ නුවරඑළිය මාගර්යේ ඇති නාන පිහිල්ල සංවධර්නයකිරිම රු.150,000.00

2.කමලාවති මියගේ නිවස අසල සිට සුජී මහතාග් නිවස අසල දක්වා මාගර්ය සංවධර්නය කිරිම රු.100000.00 ලෙස යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමියගේ යෝජනා</u>

(5) (2.12) 1160 හල්ඔය වසමේ මාතෘ සායනය ඉදිරිපිට ඇති සභාව සතු බස් නැවතුම්පල සංවධර්නය කිරිම රු.200000.00 වෙනුවට සංශෝධන ලෙස

1160 හල්ඔය වසමේ10 කනුව ගුනසේණ බාසුන්නැහේගේ ගරාජය අසල සිට දිවෙන මාගර්යේ පහල කොටස සංවධර්නය කිරිම රු.200000.00 ලෙස යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු වයලා විනෝදනී මන්ත්‍රීතුමියගේ යෝජනා</u>

(5) (2.13)හුනුකොටුගම සමගි සුභ සාධක සමිතියේ සොහොන් භූමියට පිවිසෙන මාගර්ය සංවධර්නය කිරිම රු.100000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන ලෙස

කලවැල්ගොල්ල ප්‍රජා ශාලාව අසළ ගාමිණි මුණසිංහ මයාගේ නිවස අසළ බෝක්කුව සෑදීම රු.100000.00

(5) (2.14)මැදගම්මැද්ද ලෝලන් දෙනිය පිහිල්ල අසලින් නාග ශ්‍රී බෝධිවිහාරය දක්වා පාර කොන්ක්‍රිට් කිරිම රු.100000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන ලෙස

මිල්ලගස්පිටිය සුසානභූමියට යන මාගර්ය කොන්ක්‍රීට් කිරීම රු.100000.00 සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු සුභද්‍රාසමරනායක මන්ත්‍රීතුමියගේ යෝජනා</u>

(5) (2.15) හපුගස්පිටිය යකඩාදෙනිය කඩුගන්නාව පාර දක්වා ඇති පඩිපෙල සංවධර්නය කිරිම රු.100000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන ලෙස

හපුගස්පිටිය ප්‍රජාශාලාවේ ඉහල කාමරයේ වැඩ අවසන් කිරිම කමර්ාන්තය(රු.200000.00) සඳහා වෙන්කර ඇති මුදලට අමතරව ඉහත කමර්ාන්තයේ මුදල වන රු.100000.00 මුදල වෙන්කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

ඉහත සදහන් සංශෝධන කමර්ාන්ත සියල්ල පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

සභාවේ තිබෙන මුදල් ප්‍රතිපාදන වලින් තවත් ලක්ෂ 5 බැගින් සියළුම මන්ත්‍රීවරුන්ට ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

ඉහත සදහන් සංශෝධන කමර්ාන්ත හා සියළු යෝජනා පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>(6) කාරක සභා වාර්ථා කමිටු වාතර්ා ඉදිරිපත් කිරීම</u>

1. අප්‍රේල් මාසයට අදාළ ධාවන සටහන් වාර්ථා ඉදිරිපත් කිරීම

2.උඩපළාත ප්‍රාදේශීය සභා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්ථාව 2021.05.03

3. ටෙන්ඩර් කමිටු වාර්ථාව 2021.05.11

ඉහත සදහන් කමිටු වාර්ථා සියල්ල පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා</u>

ඉහත සදහන් කමිටු වාර්ථා සියල්ල පිළිගැනිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්ථා වල ටෙන්ඩර් කමිටු තීරණ වලදී තීරණය කල නොහැකි කාරණා 2ක් ඇති බවත් 252-6339 කැබ් රථයේ නැවත මිළ ගණන් කැදවීමේදී එක් ආයතනයක් මිළ ගණන් ලබාදී ඇතිමුත් අප සභාව මඟින් ඉල්ලා සිටි පරිදි ලබාදී නොමැති බවත් එහිදි අංග සම්පූණර් බොඩියක් තැබීමට ඉල්ලා ඇති මුත් මෙම ආයතනයෙන් රු. හයලක්ෂයක පමණ මුදලක් ඉල්ලා ඇති බවත් එනිසා අපි ලියාපදිංචි ආයතන වලින් කෙතරම් මිළ ගණන් කැදවූවත් ඵලක් නොවන බවත් අංගසම්පූණර් බොඩි තබන ආයතන අප සමඟ ලියාපදිංචි වී නොමැති නිසා මෙවන් ප්‍රශ්න මතුවන බවත් අපේ අවශ්‍යතාවය එම අයට පණිවිඩය යන පරිදි කටයුතු කල යුතු බවත් ඒ අනුව මේ සඳහා පවත්නා ආයතන සොයා ගෙන නැවත පුවත්පත් වල මිළ ගණන් ඉල්ලා නිවේදන දැමිය යුතු බවත් සදහන් කරන ලදි.

PF-7352 වාහනය අළුත්වැඩියාව සඳහා මිළ ගණන් ඉදිරිපත් වී නොමැති නිසා අපට අවශ්‍ය බවට ආයතන වලින් මිළ ගණන් කැදවා ඒ අනුව වඩාත් සුදුසු ක්‍රමයකට ගොස් සීට් කවර හදන ආයතනවලට ගොස් මිල ගණන් ලබාගෙන දැනුවත් කර ඒ අනුව කටයුතු කල යුතු බව සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

(7) ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම -

2021 මාර්තු මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවට ඉදිරිපත් කරමින් මාර්තු මස ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තා පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**උඩපළාත ප්‍රාදේශීය සභාව**

**ආදායම් වියදම් වාර්තාව - 2021 මාර්තු**

| | ආදායම් | | | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| **10** | වරිපනම් හා බදු | | | 1 | වැටුප් හා දීමනා | 4,715,811.78 |
| i | වරිපනම් හා බදු | 87,415.34 | | | | |
| ii | අක්කර බදු | | | 2 | ගමන් වියදම් | 73,680.00 |
| iii | ජල ගාස්තු | 33,350.00 | | | | |
| iV | ව්‍යාපාර බදු | 115,850.00 | 236,615.34 | 3 | සැපයුම් හා උපකරණ | 541,894.00 |
| **20** | කුළී | | | | | |
| i | ගෙවල් කුළී | 2,375.00 | | 4 | ප්‍රාග්ධන වත්කම් | |
| ii | වෙළඳ අයිතිය බදු දීම | 329,752.91 | | | අළුත්වැඩියාව හා | 177,643.16 |
| iii | පොදු වැසිකිළිය | 5,000.00 | | | නඩත්තුව | |
| iv | බදු මුදල් | | | | | |
| v | කුලියට දීම | | 337,127.91 | | | |
| **30** | බලපත්‍ර ගාස්තු | | | | | |
| i | වෙළඳ බලපත්‍ර | 214,000.00 | | 5 | ප්‍රවාහන සම්බන්ධතා හා | 162,286.74 |
| ii | වෙළඳ බලපත්‍ර ත්‍රිරෝද | 31,200.00 | 245,200.00 | | අවශ්‍යක සේවා | |
| **40** | සේවා සඳහා ගාස්තු | | | | | |
| i | ලි.ප. සහතික හා | 255,488.88 | | 6 | පොලී ගෙවීම් | 8,502.61 |
| | පරීක්ෂණ ගාස්තු | | | | ලාභාංශ හා ප්‍රසාද මුදල් | |
| ii | අය කර ගත හැකි ගාස්තු | 1,446,321.75 | 1,701,810.63 | | | |
| **50** | වරෙන්තු ගාස්තු හා දඩ | | | 7 | ආධාර මුදල් දායක මුදල් | 37,906.00 |
| | | | | | සහනාධාර | |
| i | දඩ මුදල් | 142,334.25 | 142,512.66 | | | |
| 2 | වරෙන්තු ගාස්තු | 178.41 | | | | |
| **60** | වෙනත් ආදායම් | | | | | |
| i | පොලී | | | 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම | - |
| ii | විකුණුම් | 451,283.00 | | | ප්‍රතිලාභ පාරිතෝෂික | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| iii | මුද්දර ගාස්තු | - | | | | |
| iV | සේවක ණය පොළී | 54,826.18 | 506,109.18 | | | |
| **70** | <u>වෙනත් ආධාර</u> | | | 9 | ප්‍රාග්ධන වැය | - |
| i | පරිපාලනමය ප්‍රතිපූර්ණ | 8,123,663.92 | | | | |
| ii | සාමූහික ආධාර | 60,000.00 | 8,183,663.92 | | | |
| **80** | <u>මූලධන ලැබීම්</u> | | | | අත්තිකාරම් ගෙවීම | 5,000.00 |
| i | මූලධන ආධාර | | - | | සේවක ණය | 98,150.00 |
| | සේවක ණය | | 355,687.00 | | ණයහිමි ගෙවීම් | 3,384,748.93 |
| | තැන්පත් | | 379,821.73 | | තැන්පත් | 239,083.30 |
| | කර්මාන්ත ණයගැති ලැබීම් | | 233,879.33 | | ආදායමින් ආපසු ගෙවීම් | 237,427.33 |
| | අත්තිකාරම් පියවීම | | 25,000.00 | | අතිරික්තය | 2,665,293.85 |
| | ඌනතාවය | | | | | |
| | | | **12,347,427.70** | | | **12,347,427.70** |

*<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>*

2021 මාතර්‍ මස ආදායම් වියදම් වාර්තාවේ මාසයට අදාළ ආදායම ලෙස රු.12,347,427.70 ලැබී ඇති බවත් එහිදි ආදායම් ශීෂර් යටතේ එක් එක් විෂයයන් සඳහා ආදායම් ලැබීම පිළිබඳව ඉතා පැහැදිලි දැනුවත් කිරීමක් සිදුකර ඇති බවත් මේ පිළිබඳව පුද්ගලිකව තම තමා විසින් සභාවේ ආදායම් තත්වය පිළිබඳව අවබෝධ කරගත යුතු බවත් ඒකාබද්ධ වියදම් සාරාංශය දෙස බැලූ කල රු.9,682,133.85 මාසයට අදාළ වියදම් වලින් ලැබී ඇති බවත් මේ වියදම් වලින් භෞතික සැළසුම් හා මංමාවත් යන කාරණාවේදී හා ණයහිමි ගෙවීම් යන කාරණාවේදී ණයහිමියන් ලෙස කරන්න බැරි වූ කමර්ාන්ත ඉටු කිරීම වෙනුවෙන් රු.3,130,677.16 මාතර්‍ මාසය තුළ භෞතික සැළසුම් හා මංමාවත් යන කාරණාවේදී ඔබතුමන්ලාගේ ණයහිමි කමර්ාන්ත වෙනුවෙන් ගෙවා ඇති බවත් ඒ අනුව එවන් ගෙවීම් අතිරික්තයක් ලෙස රු.2,665,293.85 එම මාසයේ පෙන්නුම් කරන බවත් එලෙස මහජන සේවාවන් සඳහා මුදල් වැය කර ඇති බවත් සමස්ථයක් ලෙස සෑම කාරණාවක්ම පවත්නා තත්වය අනුව විග්‍රහා නොකරන බවත් සඳහන් කරමින් මාතර්‍ මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තා සියල්ල පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

අද දින සභාවට නොපැමිනි ගරු ***මන්ත්‍රීතුම***න්ලාගේ සහ ***මන්ත්‍රීතු***මියන්ලාගේ නිවාඩු අනුමැතිය සඳහා සභාවට යොමු කරන ලදි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි



ගරු ප්‍රේමරත්න බංඩාර මන්ත්‍රීතුමා

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ඉදිරි මහ සභා දිනය තීරණය කිරීම අවිනිශ්චිත බැවින් දැනුම්දිය නොහැකි බවත් පවත්නා තත්වය අනුව කටයුතු කරමු යැයි සදහන් කරන ලදි.

## 8. වෙනත්

පවත්නා කොවිඩ් වසංගත තත්වය සම්බන්ධයෙන් සභාවක් ලෙස කටයුතු කල යුතු ආකාරය හා මහ ජනතාව වෙනුවෙන් සේවා සැපයීම හා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම ඒ සදහා සුදානම් වීම අවශ්‍ය බලපත්‍ර ලබාගැනීම මෙන්ම රජය මඟින් මේ සදහා පන්විලතැන්න , උඩගම රෝහල් කොරෝනා රෝගීන් සදහා වෙන් කිරීම ආදී කටයුතු මෙන්ම සභාවක් ලෙස උපකාර අවැසි වන අවස්ථාවල අපේ සභාපතිතුමාගෙන් විමසා කටයුතු කරන ලෙසත් සදහන් කරමින් කොරෝනා වසංගත තත්වය සම්බන්ධයෙන් ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා,ගරු උප සභාපතිතුමා ,ගරු අගලවත්ත මන්ත්‍රීතුමා ,ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා,ගරු තංගවේලු කාමරාජන් මන්ත්‍රීතුමා ගරු ප්‍රේමතිලක මන්ත්‍රීතුමා දීසර් ලෙස අදහස් දක්වන ලදි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

කොවිඩ් වසංගත තත්වය සම්බන්ධයෙන් ඔබතුමාට හැකි සීමාවේ සිට හැකිතාක් උදව් උපකාර සිදු කරන ලෙසත් සදහන් කරමින් ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාට එන්නත ලබාදීමට කටයුතු කරන ලෙසට යෝජනා කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අගලවත්ත මන්ත්‍රීතුමා ඉල්ලා සිටි කාරනා සදහා විමසා බලා කටයුතු කිරීමට තමා කටයුතු කල බවත් නමුත් සමහර මන්ත්‍රීතුමන්ලා සභාව මගින් කල නොහැකි යෝජනා ඉල්ලා නොසිටින ලෙසත් තමා විසින් රෝගී සත්කාරක සේවා සදහා සහ *PCR* පරීක්ෂණ සදහා මෙන්ම භාණ්ඩ බෙදා හැරීම යන කාරනා සදහා නිකුත් කර ඇති චක්‍රෙල්ඛ වලට අනුකූලව ප්‍රවාහන පහසුකම් සපයන බවත් කල නොහැකි දේ විගණන ගැටළු මතුවන නිසා නොකරන බවත්

මීල කම්ටුවට යොමුකර ප්‍රතිශක්තියට අවශ්‍ය කරන සුවධරණී බෙහෙත් නිෂ්පාදනය සදහා රු 40000.00ක මුදලත් වැයකර කොත්තමල්ලි,වෙනිවැල්ගැට, හීන් අරත්ත , ඉගුරු යන දේවල් දොළුව ආයුවෙර්දයට ලබා දුන් බවත් සදහන් කරන ලදි.

ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා

කොරෝනා වසංගත තත්වය නිසා වත්තහේන ජල ව්‍යාපෘතියේ කටයුතු පවත්නා සංචරණ සීමා නිසා අතර මග නතර කර ඇති බවත් එම ව්‍යාපෘතියේ කටයුතු ඉතා සාර්ථකව කරගෙන

ආ බවත් ඒ සම්බන්ධයෙන් සොයා බලන ලෙසත් කොරෝනා වසංගතය නිසා වත්තහේන ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කටයුතු කරන අයට ආරක්ෂිත ඇඳුම් කට්ටලයක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.



<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ආරක්ෂිත ඇඳුම් කට්ටල 20 ක් පමණ ලබාගත් බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

අද දින මුළු රටේම කොරෝනා වසංගත තත්වය තිබියදීත් උඩපළාත බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය වෙනුවෙන් මහ සභාවට සහභාගී වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් ස්තූතිවන්ත වෙමින් සියළු දෙනාට දළදා සමිඳු පිහිට ප්‍රාථර්නා කරමින් පෙ.ව.11.30.ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

ලේකම් | සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව | උඩපළාත ප්‍රාදේශීය සභාව